සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 09 - 2023

## නාට්‍ය හා රංග කලාව

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් ගද්‍ය හා පද්‍ය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

A - මුහුදු පතුල යට ඉඳලා - මුතු ඇටයක නිදි කරවා
පෙන කැටියක පා කරලා- මගේ දෝතට පුතු ආවා

B - මේ අවේලාවේ ඔබ වහන්සේ මේ විමානයට වැඩියේ ඇයි?

C - මහ රජාණෙනි! මම නාගසේනයයි දන්වමි.

D - සුරුට්ටු ද බොන්නේ බුලත්ම ද කන්නේ ..........

E - මේ චන්දිභට්ටයින්ගේ ගායනාව නතර කරන්ඩ ඕනෑ.

01. මිලින්ද ප්‍රශ්නය හා සම්බන්ධ අක්ෂරය වන්නේ,
i. A ii. B iii. C iv. D

02. ගුණසේන ගලප්පත්ති මහතාගේ නාට්‍යයක සංවාද / ගීත ඛණ්ඩය සහිත අක්ෂරය වන්නේ,
i. A ii. B iii. C iv. D

03. සුබ සහ යස නාට්‍යයේ සංවාද / ගීත ඛණ්ඩය සහිත අක්ෂරය වන්නේ,
i. B ii. C iii. D iv. E

04. දයානන්ද ගුණවර්ධන මහතාගේ නාට්‍යයක සංවාද / ගීත ඛණ්ඩයක අක්ෂරය වන්නේ,
i. B ii. D iii. C iv. E

05. ආලවක දමනය හා සම්බන්ධ සංවාද / ගීත ඛණ්ඩයක අක්ෂරය වන්නේ,
i. B ii. C iii. D iv. E

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

06. නාට්‍යයක තේමාව යනු,
i. නාට්‍ය ශෛලිය යි. ii. පෙළින් කියවෙන ප්‍රධාන අදහස යි.
iii. අනුකරණය යි. iv. සමාරෝපය යි.

07. නාට්‍යයක් වේදිකාගත වන අවස්ථාවේ වේදිකාවේ සියලු කාර්යයන් මෙහෙය වන්නේ,
i. ආනුශංගික ශිල්පීන් විසිනි ii. නළු නිළියන් විසිනි
iii. වේදිකා පරිපාලක විසිනි iv. අධ්‍යක්ෂක විසිනි

08. නාට්‍යයක පසුතල නිර්මාණ අයත් වන අභිනය වන්නේ,
i. වාචික අභිනය යි ii. ආංගික අභිනය යි iii. සාත්වික අභිනය යි iv. ආහාර්ය අභිනය යි

09. අංග රචනය සඳහා භාවිතයට ගන්නා ද්‍රව්‍යයක් නොවන්නේ,
i. නෝස් පොටි ii. දිය සායම් iii. පදනම් ආලේපය iv. ස්ප්‍රිට් ගම්

10. යම් පුද්ගලයෙකුගේ චර්යාවන් තවත් අයෙක් ඒ අයුරින්ම කරයි නම් එය,
i අනුකරණය යි ii. සමාරෝපය යි iii. රූපනය යි iv. අභිරූපනය යි

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් පින්තූර ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

**A**



**B**



**C**



**D**



**E**



11. මුහුදු පුත්තු නාට්‍ය සඳහා රංගනයෙන් දායක වූ ශිල්පියා/ශිල්පිනිය වන්නේ,
i. B ii. C iii. D iv. E

12. මධුර ජවනිකා, ආනන්ද ජවනිකා යන වාර්තාගත රංග නිර්මාණකරු වන්නේ,
i. A ii. C iii. D iv. E

13. දශක තුනකට ආසන්න කාලයක් සිංහබාහු සඳහා රංගනයෙන් දායක වන්නේ,
i. A ii. C iii. D iv. E

14. 1956 මනමේ නාට්‍යයේ මුල් කාලයේ රංගනයෙන් දායක වූ ශිල්පියා / ශිල්පිනිය වන්නේ,
i. A ii. B iii. C iv. D

15. සඳ කිඳුරු, දේවතා එළි, දෑස නිසා යන නාට්‍ය නිර්මාණකරු වන්නේ,
i. A ii. B iii. C iv. D

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

| A | B | C | D | E |
|---|---|---|---|---|
| දහඩිය දැමීම | රංගවිධාන | සැහැල්ලු බව | පද්‍යමය සංවාද | වේෂ භූෂණ |
| ඇඟ වෙව්ලීම | ගැටුම | අදාළ බව | ගමන් තාල | හඬෙහි ස්වරය |
| සිරුර දරදඬුවීම | තේමාව | වර්ණය | චරිතාංග අංගරචනය | අදාළ ඉරියව් |

16. A අක්ෂරයේ සඳහන් කරුණු අදාළ වන්නේ,
i. වාචික අභිනයට ය ii. ආංගික අභිනයට ය iii. සාත්වික අභිනයට ය iv. ආහාර්ය අභිනයට ය

17. B අක්ෂරයේ සඳහන් කරුණු අදාළ වන්නේ,
i. අනුකරණයට ය ii. සමාරෝපනයට ය
iii. ආනුශංගික කලාවලට ය iv. නාට්‍ය පෙළට ය

18. චරිත නිරූපණය සඳහා වඩාත් අදාළ කරුණු සහිත අක්ෂරය වන්නේ.
i. B ii. C iii. D iv. E

19. D අක්ෂරයේ සඳහන් කරුණු අදාළ වන්නේ,
i. ලෝක ධර්මී ශෛලියට ය ii. නාට්‍ය ධර්මී ශෛලියට ය
iii. චරිත නිරූපනයට ය iv. ක්‍ෂනික නිරූපනයට ය

20. C අක්ෂරයේ සඳහන් කරුණු අදාළ වන්නේ,
i. නාට්‍යෝපකරණයට ය ii. ආලෝකකරණයට ය
iii. නාට්‍ය සංගීතයට ය iv. රංග වින්‍යාසයට ය

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03කට පිළිතුරු සපයන්න.**
- **පහත සඳහන් සංවාද කණ්ඩය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

සිටුදුව : මේ වළලු වගයක් බලනවා අත්තම්මේ, එන්නකෝ අත්තම්මත් ඇවිල්ලා බලන්න. ඇත්තෙන්ම අපූරුයි.

මිත්තනිය : කසී රටෙන්? මොන පිස්සුද? කසී රටෙන් වළලු ගේනවායැ? අන්න කසී රටේ සළු නම් හදනවා. බොරු කියන්නේ මිනිස්සු රවට්ටන්න.

01. i. ඉහත සංවාද ඇතුළත් නාට්‍ය හා එහි පෙළ රචකයා සඳහන් කරන්න. (ල. 02)
 ii. එම නාට්‍ය සඳහා යොදාගත් ජාතකය කුමක් ද?
 නාට්‍යයේ ශෛලිය කුමක් ද? (ල. 02)
 iii. මෙම නාට්‍යයේ යොදාගත් රංග භාණ්ඩ දෙකක් ලියන්න. (ල. 02)
 iv. මෙම නාට්‍යයේ ප්‍රධාන තේමාව හා අතුරු තේමාවන් ලියන්න. (ල. 02)
 v. මෙම නාට්‍යයේ නිර්මාණකරුගේ තවත් නාට්‍ය 2ක් ලියන්න. (ල. 02)

02. i. ආනුශංගික කලා යන්න හඳුන්වන්න. (ල. 02)
 ii. ආනුශංගික කලා අංග 3 ලියන්න. (ල. 03)
 iii. ආනුශංගික අංග භාවිතයේ දී සැළකිය යුතු කරුණු මොනවාද? පැහැදිලි කරන්න. (ල. 05)

03. i. බෞද්ධ පූජා කර්ම යන්න හඳුන්වන්න. (ල. 02)
 ii. බෞද්ධ පූජා කර්ම 3 ලියන්න. (ල. 03)
 iii. ඉන් එකක් හඳුන්වන්න. (ල. 05)

04. i. ගැටුම යනු කුමක් ද? (ල. 02)
 ii. ගැටුමේ ප්‍රභේද 3 දක්වන්න. (ල. 03)
 iii. එම ප්‍රභේද සඳහා කදාවළලු නාට්‍යයෙන් නිදසුන් සපයන්න. (ල. 05)

05. • **පහත දැක්වෙන සිද්ධිය ඇසුරුකරගෙන නාට්‍ය පිටපතක් රචනා කරන්න.**

සඳරු ක්‍රිකට් ක්‍රීඩාවට ඉතාම දක්ෂ සිසුවෙකි. ආර්ථික අපහසුකම් හමුවේ වුවද අධ්‍යාපනයට ද උනන්දුය. දිනක් ක්‍රිකට් තරඟයක් සඳහා යෑමට සූදානමින් යන සඳරුගේ බෑගය ශිෂ්‍ය නායකයින් විසින් පරීක්ෂාකරන විට.........

 i. පසුබිම, කාලය, චරිත මැවීමට රංගවිධාන හා සංවාද සහිතව පෙළ රචනය (ල. 03)
 ii. ගැටුම් සහිත අවස්ථා ගොඩනැඟීමට (ල. 03)
 iii. නොසිතූ පෙරළියක් සහිත නිර්මාණශීලී නාට්‍ය නිමාවට (ල. 04)